# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය
# 2024 (2025)

# මාර්ගගතව අයදුම්පත් යොමුකිරීම සඳහා උපදෙස්

ආයතනික විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

# පටුන

**01.** සාමාන්‍ය තොරතුරු
- 1.1 ලියාපදිංචි පිරිවෙන්
- 1.2 ලියාපදිංචි අංකය
- 1.3 තොරතුරු යාවත්කාලීන කිරීම
- 1.4 නව පිරිවෙන් ලියාපදිංචි කිරීම
- 1.5 පරිශීලක නාමය හා මුරපදය
- 1.6 විභාගය පැවැත්වෙන නගර ලේඛනය

**02.** අයදුම්පත් ඉදිරිපත් කිරීම
- 2.1 පොදු උපදෙස්
- 2.2 විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්
- 2.3 ඌන සාමර්ථ්‍යය

**03.** විභාග ගාස්තු

**04.** ප්‍රවේශ පත්‍ර බාගත කිරීම

**05.** විභාග ප්‍රතිඵල
- 5.1 ප්‍රතිඵල සටහන් වන ආකාරය
- 5.2 ප්‍රතිඵල ලේඛන ලබා ගැනීම

**06.** නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීම

**07.** විමසීම
- 7.1 දුරකථන අංක
- 7.2 විද්‍යුත් තැපැල් ලිපින

## 01. සාමාන්‍ය තොරතුරු:

### 1.1 ලියාපදිංචි පිරිවෙන්

| දිස්ත්‍රික්ක අංකය | දිස්ත්‍රික්කය | ලියාපදිංචි පිරිවෙන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | මූලික | මහ | විද්‍යායතන | වෙනත් |
| 01 | කොළඹ | 34 | 11 | 03 | 03 |
| 02 | ගම්පහ | 36 | 24 | 04 | 04 |
| 03 | කළුතර | 31 | 10 | 08 | 02 |
| 04 | මහනුවර | 46 | 26 | 08 | 02 |
| 05 | මාතලේ | 12 | 11 | 01 | - |
| 06 | නුවරඑළිය | 06 | 04 | 01 | - |
| 07 | ගාල්ල | 50 | 19 | 04 | 02 |
| 08 | මාතර | 49 | 13 | 07 | - |
| 09 | හම්බන්තොට | 29 | 10 | 01 | - |
| 13 | වව්නියාව | 01 | - | 01 | - |
| 14 | මුලතිව් | 01 | - | - | - |
| 15 | මඩකලපුව | - | - | 01 | - |
| 16 | අම්පාර | 16 | 05 | - | - |
| 17 | ත්‍රිකුණාමලය | 06 | 01 | - | - |
| 18 | කුරුණෑගල | 40 | 40 | 06 | 01 |
| 19 | පුත්තලම | 08 | 06 | - | - |
| 20 | අනුරාධපුරය | 27 | 15 | 03 | 01 |
| 21 | පොළොන්නරුව | 08 | 07 | - | - |
| 22 | බදුල්ල | 27 | 11 | 03 | 01 |
| 23 | මොනරාගල | 19 | 06 | 02 | - |
| 24 | රත්නපුර | 37 | 10 | 05 | - |
| 25 | කෑගල්ල | 19 | 19 | 06 | - |
| එකතුව | | **502** | **248** | **64** | **16** |

## 1.2 ලියාපදිංචි අංකය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයේ ලියාපදිංචි සෑම පිරිවෙනක් සඳහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පරිගණක අංකයක් නිකුත් කර ඇත.

## 1.3 තොරතුරු යාවත්කාලීන කිරීම

පිරිවෙන වෙත ලබාදී ඇති පරිශීලක නාමය හා මුර පදය භාවිත කර Piriven Exams පද්ධතියට පිවිසීමෙන් පසු පිරිවෙනේ ලිපිනය, දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, පරිවෙනාධිපතිවරයාගේ නම ආදී තොරතුරු යාවත්කාලීන කළ යුතු වේ. පිරිවෙනේ නම සංශෝධනය කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශය හරහා අයදුම් කළ යුතුය.

## 1.4 නව පිරිවෙන් ලියාපදිංචි කිරීම

නව පිරිවෙන් ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශය මඟින් අයදුම් කළ යුතුය. එහිදී එක් ලිපිනයක් යටතේ ලියාපදිංචි කළ හැක්කේ එක් පිරිවෙනක් පමණි.

## 1.5 ලියාපදිංචි අංකය

පිරිවෙන් වෙත ලබා දෙන පරිශීලක නාමය (User Name) හා මුර පදය (Password) මේ වන විට නිකුත් කර ඇත. සියලුම පිරිවෙන් විභාග සඳහා ඉදිරියේදී මෙම පරිශීලක නාමය (User Name) හා මුරපදය (Password) භාවිතවන බැවින් එය පරිවෙනාධිපතිවරුන් සතුව සුරක්ෂිතව තබාගත යුතු වන අතර අන්සතු කිරීමෙන් වැළකිය යුතුය.

## 1.6 විභාගය පැවැත්වෙන නගර ලේඛනය

| නගර අංකය | නගරය |
|---|---|
| 102 | නුගේගොඩ |
| 103 | පන්නිපිටිය |
| 201 | ගම්පහ |
| 301 | කළුතර |
| 302 | හොරණ |
| 303 | බණ්ඩාරගම |
| 402 | පේරාදෙණිය |
| 501 | මාතලේ |
| 701 | ගාල්ල |
| 801 | මාතර |

| නගර අංකය | නගරය |
|---|---|
| 902 | තංගල්ල |
| 903 | හුංගම |
| 1601 | අම්පාර |
| 1602 | දෙහිඅත්තකණ්ඩිය |
| 1701 | ත්‍රිකුණාමලය |
| 1801 | කුරුණෑගල |
| 1802 | වාරියපොල |
| 1803 | කුලියාපිටිය |
| 1804 | නාරම්මල |
| 1901 | පුත්තලම |
| 2001 | අනුරාධපුරය |
| 2002 | තලාව |
| 2101 | පොළොන්නරුව |
| 2202 | හාලිඇල |
| 2203 | දියතලාව |
| 2204 | මහියංගනය |
| 2301 | මොනරාගල |
| 2302 | ඇතිලිවැව |
| 2401 | රත්නපුර |
| 2402 | ඇඹිලිපිටිය |
| 2501 | කෑගල්ල |
| 2502 | හකහින්න |

## 02. අයදුම්පත් ඉදිරිපත් කිරීම

- පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025) සඳහා මාර්ගගතව අයදුම්පත් භාරගැනීම 2024.12.19 වන දින පෙ.ව. 09.00 ට ආරම්භ වන අතර 2025.01.15 වන දින ප.ව. 09.00 ට අවසන් වේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර විභාග නිවේදනයේ සහ මෙහි සඳහන් පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් කියවා අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

- පිරිවෙන් අයදුම්කරුවන් පරිවෙනාධිපති මගින් ද පෞද්ගලික අයදුම්කරුවන් පෞද්ගලිකව ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

### 2.1 පොදු උපදෙස්

I. මාර්ගගත විභාග අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් පිරවිය යුතුය.

II. මාර්ගගත අයදුම්පතේ සඳහන් සියලුම කොටස් මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කළ යුතුය.

III. පිරිවෙනේ ලිපිනය, ප්‍රධානාචාර්යවරයාගේ තොරතුරු, දුරකථන අංක සහ පිරිවෙන අයත් දිස්ත්‍රික්කය සහ විභාගයට පෙනී සිටීමට අවශ්‍ය වන නගර දෙකක් අනිවාර්යෙන්ම සඳහන් කළ යුතු වේ. විභාග මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී නොසිටින අවස්ථාවලදී අදාළ අයදුම්කරුවන් ඊට ආසන්න නගරයේ පිහිටි විභාග මධ්‍යස්ථාන වෙත යොමු කරනු ලැබේ.

IV. පද්ධතියට අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයටම විය යුතු අතර, ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

V. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. යම් අයදුම්කරුවකුට තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් හෝ භාෂා මාධ්‍ය දෙකෙන්ම (ද්වි මාධ්‍ය) විභාගයට පෙනී සිටිය හැකිය.

VI. අයදුම්පත යොමු කිරීමට (Submit) පෙර ඉදිරිපත් කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර තහවුරු කරගන්න.

VII විභාග ගාස්තු ගෙවිය හැක්කේ ක්‍රෙඩිට් හෝ ඩෙබිට් කාඩ් පතක් මඟින් පමණි.

VIII අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර ( Special Characters) වන “ ” ? :{}[ ] ‘ !`~#$%^*<> = + - _ / නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IX අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

X පිරිවෙන් ප්‍රධානීන් විසින් අදාළ ශිෂ්‍යයින්ගෙන් පෞද්ගලිකව විමසා තහවුරු කරගැනීමෙන් පසුව පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

XI මාර්ගගතව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අයදුම්පත pdf ක්‍රමයට බාගත (download) කරගත හැකි අතර එම පිටපත පසුව කරන විමසීම් සඳහා සුරැකිව තබා ගන්න.

XII මෙම විභාගයට පෙනී සිටින සෑම විභාග අපේක්ෂකයකුම අනිවාර්ය විෂයයන් 06 සමඟ යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක් වත් තෝරා ගත යුතුය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10 කි. අයදුම්කරුවන් එක් එක් විෂය ඉදිරියෙන් තමා පෙනී සිටීමට අපේක්ෂා කරන මාධ්‍යය ද සඳහන් කළ යුතුය.

XIII අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේදී අයදුම්කරුවන් අයදුම්කරන විෂය හා මාධ්‍ය පිළිබඳ අවබෝධයකින් යුතුව සඳහන් කළ යුතු අතර කවර හේතුවක් නිසාවත් විභාගය පැවැත්වෙන අවස්ථාවේදී අයදුම්කර ඇති මාධ්‍ය හා විෂයන් වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

### 2.2 විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්

විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා අයදුම්කරුවන් ඇතුළත් කරන අවස්ථාවේදී එම පෝරමය මඟින් ඔවුන්ගේ තොරතුරු ලබා ගැනේ. එය නිවැරදිව සම්පූර්ණ කිරීම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීමට පහසුවක් වේ.

### 2.3 ඌන සාමාර්ථය

ත්‍රිපිටක ධර්මය සමඟ පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් පහ (05)කින් සමත්වීම හෝ අනිවාර්ය විෂයයන් දෙකක් ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම හේතුවෙන් ඌන සාමාර්ථය හිමි වේ. අනුගාමී වර්ෂ දෙකක් ඇතුළත ඌන සාමාර්ථය සම්පූර්ණ කළ යුතුය.

## 03. විභාග ගාස්තු

සියලුම පිරිවෙන් අයදුම්කරුවන් පළමු වර සහ දෙවැනි වර විභාගයට පෙනී සිටීමේදී විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවන අතර දෙවැනි වරට පසුව විභාගයට පෙනී සිටින සෑම වරකදීම විභාග ගාස්තු ලංකා බැංකුව, පැලවත්ත ශාඛාවේ විභාග කොමසාරිස්ගේ ගිණුම් අංක 7041227 වෙත ගෙවිය යුතුය. පෞද්ගලික අයදුම්කරුවන් පළමු වර විභාගයට පෙනී සිටීමේදී ද විභාග ගාස්තු ගෙවිය යුතු වේ. පෞද්ගලික අයදුම්කරුවන් විභාග ගාස්තු ගෙවිය යුත්තේ බැංකු හර/බැරපතක් (Debit/Credit) මඟින් පමණි.

| | | | |
|---|---|---|---|
| එක් විෂයකට | - රුපියල් 40/- | විෂයයන් හතරකට | - රුපියල් 100/- |
| විෂයයන් දෙකකට | - රුපියල් 60/- | විෂයයන් පහකට | - රුපියල් 120/- |
| විෂයයන් තුනකට | - රුපියල් 80/- | විෂයයන් හයකට හෝ ඊට වැඩි | - රුපියල් 200/- |

## 04. ප්‍රවේශ පත්‍ර බාගත කිරීම

ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව පිරිවෙන වෙත ලබා දී ඇති පරිශීලක නාමය හා මුරපදය භාවිතා කර මාර්ගගත පද්ධතියෙන් ප්‍රවේශ පත්‍ර බාගත කළ හැකිය.

## 05. විභාග ප්‍රතිඵල

### 5.1 ප්‍රතිඵල සටහන් වන ආකාරය

A - විශිෂ්ට සාමර්ථ්‍යය

B - අධිසම්මාන සාමර්ථ්‍යය

C - සම්මාන සාමර්ථ්‍යය

S - සාමාන්‍ය සාමර්ථ්‍යය

W - දුර්වල

\+ - නොපැමිණි

N - විෂයයේ ප්‍රතිඵල අත්හිටුවා ඇත.

### 5.2 ප්‍රතිඵල ලේඛන ලබා ගැනීම

පිරිවෙන් අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ පිරිවෙන් හා පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛන පෞද්ගලික ලිපිනය වෙත තැපැල් මඟින් එවනු ලැබේ.

## 06. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීම

පරිවෙනාධිපතිවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

## 07. විමසීම්

### 7.1 දුරකථන අංක

| | |
|---|---|
| ආයතනික විභාග සංවිධාන ශාඛාව | - 011 278 5230 / 011 278 6150 |
| | - 011 366 1244 |
| ෆැක්ස් | - 011 278 4232 |
| මාර්ගගත ඒකකය (තාක්ෂණික උපදෙස්) | - 011 366 1122 / 011 367 1568 |
| | - 011 366 1246 |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව | - 011 278 5141 / 011 278 4910 |
| | - 011 278 4893 |

### 7.2 විද්‍යුත් තැපැල් ලිපින

| | |
|---|---|
| ආයතනික විභාග සංවිධාන ශාඛාව | - intexorganizations@gmail.com |
| මාර්ගගත ඒකකය (තාක්ෂණික උපදෙස්) | - doeonlineexams@gmail.com |

******